5 ශ්‍රේණිය - සිංහල

දෙවන වාරය- සිසු සටහන 20

<u>ඈ/ ඇය/ ඔහු/ඌ උක්තය ලෙස යෙදුනු වර්තමාන කාල වාක්‍ය ලිවීම</u>

මගේ නම හසිත ඉඳුවර වික්‍රමසිංහ යි. මගේ අම්මාගේ නම පවිත්‍රා ජයසිංහ යි. ඈ ගුරුවරියකි. ඇය සේවය කරන්නේ ධර්මාශෝක විද්‍යාලයේ යි. ඇය සිංහල භාෂාව උගන්වයි. ඇය විවේකයෙන් සිටින වේලාවට පොත් කියවයි. විවිධ සඟරා කියවයි. ඇය රසවත් කතන්දර පවසයි. ඇය සුමිහිරි ලෙස ගීත ගයයි. ඇය දක්ෂ ගුරුවරියක බව මගේ විශ්වාසය යි.

මගේ තාත්තාගේ නම පවිත්‍ර වික්‍රමසිංහ යි. ඔහු දක්ෂ චිත්‍ර ශිල්පියෙකි. ඔහු ඉතා අලංකාර ව මිනිස් රූප, සත්ත්ව රූප සහ පරිසරය සිතුවමට නඟයි. ඔහුට යමක් දෙස බලා එය ඒ ආකාරයට ම සිතුවමට නැඟීමට හැකි යි. ඔහු චිත්‍ර වර්ණ ගැන්වීමට දිය සායම් යොදා ගනියි. ඔහු චිත්‍ර ප්‍රදර්ශන ද පවත්වයි. මගේ තාත්තා පිළිබඳ ව මම ආඩම්බර වෙමි.

මගේ සුරතලා කිටියා යි. ඌ සැමට පෙර උදෑසනින් ම කිරිවලින් කුස පුරවා ගනියි. අනතුරු ව ඌ ඤාව් ඤාව් කියමින් නිවසේ සියලු දෙනා ම අවදි කරවයි. ඌ සියුම් හෝ ශබ්දයකටත් ඇස් ලොකු කර බලා සිටියි. ඌ සැම විට ම සෙල්ලම ප්‍රිය කරයි. ඌ සැම විට ම බලා සිටින්නේ මා සමඟ සෙල්ලම් කිරීමට යි.

➤ ඡේදය ඇසුරෙන් වාක්‍ය ලියන්න

## අම්මා

මගේ අම්මාගේ නම . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

## තාත්තා

මගේ තාත්තාගේ නම . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

## කිරියා

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

**ගැළපෙන පරිදි 'ඈ/ඇය, ඔහු, ඌ' යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.**

1. වෙද මහතා ඖෂධ පැළෑටි සෙවීමට කැලයට යයි.
   . . . . . . . . . . . දුර්ලභ ගණයේ ඖෂධ පැළෑටි සොයා ගනියි.
2. මොනරා පිල් විදහා නැටුමක් නටයි.
   . . . . . . . . . . . . ආඩම්බරයෙන් වටපිට බලයි.
3. ඉංජිනේරුවරයා නිවාස සංකීර්ණයක් ඉදිකිරීම සඳහා පිටත් වෙයි.
   . . . . . . . . . . . ඒ සඳහා උපදෙස් සපයයි.
4. ගුරුතුමිය සැම විට ම සිනා මුසු මුහුණින් සිටියි.
   . . . . . . . . . . . . . . . ප්‍රිය වචනයෙන් කතා කරයි.
5. වෙළෙඳ ව්‍යාපාරිකයා උගත්, බුද්ධිමත් අයෙකි.
   . . . . . . . . . . . . . තම ව්‍යාපාරය සාධාරණ ව පවත්වා ගෙන යයි.